1. සිංහල දමිළ අලුත් අවුරුද්දේදී ශාන්තිනී *ලඩ්ඩු* 5ක් රැගෙන කමලා හමුවීමට පැමිණියාය. කමලා ලග *කැවුම්* 7ක් ඇත. කමලාට කැවිලි පිගානක් පිළියෙල කිරීමට කැවිලි 10ක් තෝරා ගත හැකි ආකාර ගණන කොපමණද?

(A) 1 (B) 2 (C) 3 (D) 4 (E) 5

2. 1234123412341234 යන සංඛ්‍යාවේ සංඛ්‍යාංක 10ක් ඉවත් කිරීමෙන් සෑදිය හැකි කුඩාම නිඛිලය වනුයේ,

(A) 111121 (B) 111122 (C) 111123 (D) 111124 (E) 111142

3. සරත්ගේ හා මීනාගේ වයස් වල එකතුව 25කි. කමල්ගේ හා අබ්දුල්ගේ වයස් වල එකතුව 40කි. කමල් අඩු තරමේ අවුරුදු 2කින් සරත්ට වඩා බාල වේ නම් අබ්දුල්, මීනාට වඩා අඩු තරමේ අවුරුදු කීයකින් වැඩිමල් වේ ද?

(A) 15 (B) 16 (C) 17 (D) 25 (E) 40

4. කන්ජනාගේ පාසලෙහි චෙස් ක්‍රීඩා කරන ළමුන්ගෙන් පහෙන් හතරක් හොකී ක්‍රීඩා කරන අතර හොකී ක්‍රීඩා කරන ළමුන්ගෙන් තුනෙන් දෙකක් චෙස් ක්‍රීඩා කරයි. හොකී ක්‍රීඩා කරන ළමුන් : චෙස් ක්‍රීඩා කරන ළමුන් යන අනුපාතය සමාන වන්නේ,

(A) 5 : 12 (B) 10 : 3 (C) 5 : 6 (D) 6 : 5 (E) 3 : 5

5. පහත $1cm \times 1cm$ කොටු වලින් සමන්විත රූපයේ අඳුරු කල කොටසේ වර්ග ඵලය වනුයේ,



(A) 32.5 cm^2 (B) 31.5 cm^2 (C) 30.5 cm^2 (D) 28.5 cm^2 (E) 26.5 cm^2

26. තණකොළ පෙත්තෙක් සරල රේඛාවක් ඔස්සේ දිශා දෙකටම පනී. ඔහු A ලක්ෂයෙන් ගමන අරඹා පිළිවෙලින් 1cm, 2cm, 3cm, … දුරවල් පනී. පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ සත්‍ය වේද?

I ඔහුට වාර 4කින් නැවතත් A කරා පැමිණිය නොහැක

II ඔහුට වාර 2010කින් නැවතත් A කරා පැමිණිය නොහැක

III ඔහුට වාර 4020කින් නැවතත් A කරා පැමිණිය නොහැක

(A) I පමණි (B) II පමණි (C) III පමණි (D) I සහ II පමණි (E) කිසිවක් නොමැත

27. සංඛ්‍යාංක 4කින් යුත් සංඛ්‍යාවක් එම සංඛ්‍යාවේ සංඛ්‍යාංක අග සිට මුලට ලියූ විට ලැබෙන සංඛ්‍යාවට වඩා 4ගුණයකින් අඩුය. එනම් සංඛ්‍යාව *x* හා එම සංඛ්‍යාවේ සංඛ්‍යාංක අග සිට මුලට ලියූ විට ලැබෙන සංඛ්‍යාව *y* නම්, $x=4y$ වේ. එම සංඛ්‍යාංක 4කින් යුත් සංඛ්‍යාව ගැන කුමක් කිව හැකිද?

I දහස්තානය 2 වේ

II සියස්තානය 1 වේ

III උපරිම වශයෙන් මෙවැනි සංඛ්‍යා ඇත්තේ 1ක් පමණි

(A) I පමණි (B) II පමණි (C) III පමණි (D) Iහ සහ II පමණි (E) සියල්ලම

28. සිසුවෙක් *SLMC 2010* තරගාවලියේ ගැටළු 5කට හැර ඉතිරි ගැටළු සියල්ලටම නිවැරදිව පිළිතුරු දෙයි. මෙම ගැටළු 5ට ඔහු දෙන පිළිතුරු වැරදි පිළිතුරු වන අතර එම ගැටළු අනුයාත නොවේ. මෙය සිදුවිය හැකි එකිනෙකට වෙනස් ආකාර ගණන කොපමණද?

(A) 26x25x24x23x22 (B) $^{26x25x24x23x22}/_{5x4x3x2x1}$ (C) 5x5x5x5x5
(D) $^{25x25x25x25x25}/_{5x4x3x2x1}$ (E) $^{30x29x28x27x26}/_{5x4x3x2x1}$

29. 10, 110, 1110, 11110, … යන සංඛ්‍යා අනුක්‍රමය සඳහා කුමන ප්‍රකාශය/ප්‍රකාශ සත්‍ය වේද?

I මෙම අනුක්‍රමයේ සෑම දෙවන පදයක්ම 11න් බෙදේ

II මෙම අනුක්‍රමයේ සෑම තෙවන පදයක්ම 3න් බෙදේ

III මෙම අනුක්‍රමයේ 2010න් බෙදෙන පදයක් ඇත

(A) I පමණි (B) II පමණි (C) III පමණි (D) I සහ II පමණි (E) සියල්ලම

30. *I. N. Finity* විසින් කරවන ලද *Infinity* ක්‍රිකට් ක්‍රීඩාගාරයෙහි අපිරිමිත තරග ගණනකින් යුක්ත T20 තරගාවලියක් පැවැත්වීමට නියමිත අතර *n* වන තරගය සඳහා ටිකට් පතක මිල, *n-1* වන තරගයේ ටිකට් පතක මිල මෙන් $1 - {}^{1}/_{n^2}$ ගුණයකි. පළමු තරගය සඳහා ටිකට් පතෙහි මිල රුපියල් 4000ක් නම් පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ සත්‍ය වේද?

I ටිකට් පතෙහි මිල රුපියල් 2010ක් වන තරගයක් පවතී

II 2010424 වන තරගය සඳහා ටිකට් පතෙහි මිල රුපියල් 2000ට වැඩිය

III ඕනෑම තරගයක් සඳහා ටිකට් පතක මිල රුපියල් 2000ට වැඩිය

(A) I පමණි (B) II පමණි (C) III පමණි (D) I සහ II පමණි (E) සියල්ලම